සියලු ම හිමිකම් ඇවිරිණි

විශාඛා විද්‍යාලය, කොළඹ 05

දෙවන වාර පරීක්ෂණය - 2018

ගණිතය

8 ශ්‍රේණිය

කාලය : පැය 2 යි

නම / අංකය : ..............................................................................................................

SKY TEL LANKA
Grade 6 to 11 Past Papers
DELKANDA
PRINT HOUSE

**I කොටස**

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

1) (i) 1, 3, 6, 10, 15, 21, 28, .......... ඊළඟට ලිවිය යුතු පදය ලියා දක්වන්න.

(i) එම පදය කීවෙනි සමචතුරස්‍ර සංඛ්‍යාවද?

2) (i) රූපයේ පරිමිතිය a හා b ඇසුරින් ලියන්න.




(ii) පිළිතුර සුළු කර දක්වන්න.

3) රූපයේ දක්නට ලැබෙන පරිපූරක බද්ධ කෝණ යුගලයක් නම් කරන්න.




4) (i) $(-9) - \square = (-9) + 7\frac{1}{2} = \square$ හිස් කොටු සඳහා ගැළපෙන අගය සොයන්න.

5) $a = (-4)$, $b = 2$, $c = 0$ ආදේශයෙන් $2a + 3b + 5c$ හි අගය සොයන්න.

6) (i) ද්වාදසතලයක මුහුණතක හැඩයේ නම ලියන්න.

පසුගිය ප්‍රශ්න පත්‍ර සඳහා
mathematica.lk

(ii) විංසති තලයේ හා ද්වාදසතලයේ සමානව ඇත්තේ මුහුණත් ද? දාර ද ? ශීර්ෂ ද? යන්න ලියා දක්වන්න.

7) 784 පූර්ණ වර්ග සංඛ්‍යාවකි. එහි වර්ග මූලය 20 ත් 30 ත් අතර ඇති පූර්ණ සංඛ්‍යාවකි. නිරීක්ෂණයෙන් $\sqrt{784}$ සොයන්න.

8) $-4x(\text{........} - 3y) = 8x^2, \text{.......}$ හිස්තැන් සඳහා ගැළපෙන අගය ලියන්න.



10

9) 12t 5kg කිලෝග්‍රෑම්වලින් පමණක් ලියන්න.

10) $16x^4 y^4$ ගුණිතයක බලයක් ලෙස ලියන්න.

11) නිවැරදි ප්‍රකාශ ඉදිරියෙන් "✓" ලකුණු යොදන්න.

(i) ද්විපාර්ශ්වික සමමිතිය ඇති සෑම තල රූපයකටම භ්‍රමක සමමිති ගණයක් ද ඇත.

(ii) භ්‍රමක සමමිති ගණය 1 ට වැඩි වූ තල රූපවලට පමණක් භ්‍රමක සමමිති ගණයක් ද පවතී.

(iii) රොම්බසයකට භ්‍රමක සමමිති ගණයක් ද ඇත.

(iv) සමද්විපාද ත්‍රිකෝණයකට භ්‍රමක සමමිති ගණයක් නැත.

12) රූපයේ දී ඇති දත්ත අනුව $x + y + z = 2(a + b\ c)$ බව පෙන්වන්න.




13) ඒකාකාර වේගයෙන් ගමන් කරන මිනිසෙකු මිනිත්තුවකදී $\frac{2}{15}$km ක දුරක් ගමන් කරයි. ඔහු මිනිත්තු 45 කදී ගමන් කරන දුර සොයන්න.

14) 9 හි පරස්පරයෙන් 2/3 හි පරස්පරය ගුණ කළ විට ලැබෙන පිළිතුර සොයන්න.

පසුගිය ප්‍රශ්නපත්‍ර සඳහා mathematica.lk

15) $24 \times 18 = 432$ නම් $4.32 \div 1.8$ හි අගය සොයන්න.

16) වෑන් රථයක හා මෝටර් රථයක වේගයන් අතර අනුපාතය 7 : 12 කි. වෑන් රථයේ වේගය $42\text{kmh}^{-1}$ නම් මෝටර් රථයේ වේගය සොයන්න.

17) පියෙකුගේ වයස පුතෙකුගේ වයස මෙන් තුන් ගුණයට වඩා අවුරුදු 2 ක් අඩුය. දෙදෙනාගේ වයස්වල එකතුව අවුරුදු 58 කි. පුතාගේ වයස $x$ ලෙස ගෙන $x$ ඇතුළත් සමීකරණයක් ගොඩනගන්න.

18) 7 : 4 මෙම අනුපාතය ප්‍රතිශතයක් ලෙස ලියන්න.

19) (i) "MANNARAMA" යන වචනයේ අකුරු කුලකය ලියා දක්වන්න.

(ii) එම කුලකයට අයත් අවයව ගණන කොපමණ ද?

20) මුළු පෘෂ්ඨ වර්ගඵලය 384$cm^2$ වන ඝනකයක පාදයක දිග සොයන්න.

## II කොටස

පසුගිය ප්‍රශ්නපත්‍ර සඳහා mathematica.lk

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(1) (a) දිග 1m ද, පළල 45cm ද, උස 60cm ද වූ ඝනකාභ හැඩැති පියන රහිත මාළු ටැංකියක පතුල හැර ඉතිරි සියලු මුහුණත්වල තීන්ත ආලේප කරනු ලැබේ.

(i) තීන්ත ආලේප කරන ලද මුළු වර්ගඵලය සොයන්න.

(ii) එම ටැංකිය තැබීමට අවශ්‍ය ආධාරකයේ අවම වර්ගඵලය සොයන්න.

(b) ABCD සෘජුකෝණාස්‍ර තහඩුවකින් ABF හා BED යන ත්‍රිකෝණාකාර කොටස් කපා ඉවත් කරනු ලැබේ. තහඩුවේ ඉතිරි වූ අඳුරු කළ කොටස්වල මුළු වර්ගඵලය සොයන්න.




(2) පහත සරල සමීකරණ විසඳන්න.

(a) (i) $3(2-3x)-5=19$ (ii) $\frac{1}{3}\left(\frac{2x}{3}-6\right)=-4$

(b) $x(x-3)-x(x-5)$ වරහන් ඉවත් කර සුළු කරන්න.

(c) $a=3,\ b=(-2)$ හා $c=-1$ ආදේශයෙන් $a(a+b)-b(b-c)$ හි අගය සොයන්න.

(3) පලතුරු වෙළෙන්දෙක් විකිණීම සඳහා අඹ, ඇපල් හා දොඩම් ගෙනවිත් තිබුණි.

(i) ඔහු ගෙන ආ අඹ ගෙඩි 360 කින් 40% ක් විකුණන ලදී. විකුණාගත නොහැකි වූ අඹ ගණන සොයන්න.

(ii) විකිණීමට ගෙන ආ ඇපල් 240 කින් 156 ක් විකුණාගත නොහැකි විය. විකුණන ලද ඇපල් ගණන ප්‍රතිශතයක් ලෙස ලියන්න.

(iii) ඔහු ගෙනා දොඩම් වලින් 45% ක් විකුණන ලදී. විකුණන ලද දොඩම් ගණන 81 ක් නම් ඔහු විකිණීමට ගෙන ආ මුළු දොඩම් ගණන සොයන්න.

(iv) ඔහු එදිනට විකුණන ලද, අඹ, ඇපල් හා දොඩම් මුළු ගණන සොයන්න.



12

(4) (a) පහත දශම සුළු කරන්න.

(i) $0.092 \times 43.6$   (ii) $3.555 \div 0.15$

(b) ප්‍රසාදි රු. 50 000ක් යොදා ජනවාරි 01 දා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. විනුකි මැයි 01 දා, රු. 60 000 ක් යොදා ව්‍යාපාරයට හවුල් විය. ප්‍රසාදි ව්‍යාපාරය අරඹා දෙසැම්බර් 31 ට ලාභ ගණනය කරන ලදී. එවිට රුපියල් 315 000 ක ලාභයක් ලබා තිබුණි. එම ලාභ යොදා මුදලටත් කාලයටත් සමානුපාතික වන සේ දෙදෙනා අතර බෙදා ගන්නා ලදී.

(i) දෙදෙනා අතර ලාභය බෙදාගත් සරලම අනුපාතය සොයන්න.

(ii) දෙදෙනා ලැබූ ලාභ මුදල් වෙන වෙනම සොයන්න.

(5) (a) පහත රූපවල නොදන්නා අකුරින් දී ඇති කෝණ සොයන්න.







පසුගිය ප්‍රශ්න පත්‍ර සඳහා
mathematica.lk

(b) අගය සොයන්න

(i) $(-11) - (-15) + (-6)$

(ii) $(-5) \times (-3) \times (+1) \times (-4)$

(6) (a) $\sqrt{1764}$ හි වර්ගමූලය ප්‍රථමක සාධක වල බල මගින් සොයන්න.

(b) (i) 25t සහල් තොගයක් ලොරි රථ 8කට සමානව පටවන ලදී. එක් ලොරි රථයකට පටවන ලද සහල්වල ස්කන්ධය සොයන්න.

(ii) සහල් පටවල ලද ලොරියක ස්කන්ධය 6t 100kg ක් විය. ලොරි රථයේ පමණක් ස්කන්ධය සොයන්න.

(iii) $4 - 2\frac{2}{3}$ සුළු කරන්න.

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න




කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · T · සුතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**